රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 24/2014

මගේ අංකය: EST 5/1/49
රාජ්‍ය පරිපාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2014.11.12

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

## 2015 අයවැය යෝජනා අනුව රාජ්‍ය අංශයේ නිලධරයන් සහ විශ්‍රාමිකයන් සඳහා අන්තර් දීමනා ගෙවීම

රාජ්‍ය අංශය සඳහා 2015 අයවැය යෝජනා මඟින් රජය විසින් ප්‍රකාශිත නව වැටුප් ව්‍යුහය 2015.01.01 දින සිට බල පැවැත්වෙන පරිදි ක්‍රියාත්මක කරනු ලැබේ. එමෙන්ම විශ්‍රාමික රාජ්‍ය සේවකයින්ගේ විශ්‍රාම වැටුප ද නව වැටුප් ව්‍යුහය අනුව සංශෝධනය කර 2015.01.01 දින සිට බල පැවැත්වෙන පරිදි ක්‍රියාත්මක කර නව විශ්‍රාම වැටුප් ගෙවීමට කටයුතු කරනු ලැබේ.

**02.** යෝජිත වැටුප් ව්‍යුහය යටතේ විධායක සේවා ගණයට පහළ නිලධරයන් සඳහා 2015.01.01 දින සිට 2015.06.30 දක්වා වූ හිඟ වැටුප් 2015 ජූලි මස වැටුප සමග ගෙවනු ලැබේ. විධායක සේවා ගණය සහ ඊට ඉහළ නිලධරයන් සඳහා 2015.01.01 දින සිට 2015.08.31 දක්වා වූ හිඟ වැටුප් 2015 සැප්තැම්බර් මස වැටුප සමග ගෙවනු ලැබේ.

**03.** සියලු නිලධරයන්ගේ වැටුප්, දීමනා හා වැටුප් වර්ධක නව වැටුප් ව්‍යුහයට ගැලපීම් කරන තෙක් රාජ්‍ය අංශයේ සියලුම නිලධරයන් සහ විශ්‍රාමිකයින් සඳහා පහත සඳහන් පරිදි මාසික අන්තර් දීමනාවක් 2014 නොවැම්බර් මස සිට ගෙවිය යුතුය.

## 04. රාජ්‍ය සේවයේ නියුතු නිලධරයන් සඳහා

2006.04.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 අනුව විධායක සේවා ගණයේ ආරම්භක වැටුපට වඩා අඩු ආරම්භක වැටුප් පියවරක් සහිත මාසික වැටුප් පරිමාණ හිමි තනතුරුවල සේවය කරන නිලධරයන් සඳහා 2015.06.30 දක්වා ද විධායක සේවා ගණයේ ආරම්භක වැටුපට නොඅඩු ආරම්භක වැටුප් පියවරක් සහිත මාසික වැටුප් පරිමාණ හිමි තනතුරුවල සේවය කරන නිලධරයන් සඳහා 2015.08.31 දක්වා ද රු. 3000/- ක මාසික අන්තර් දීමනාවක් ගෙවිය යුතුය.

## 05. ත්‍රිවිධ හමුදා සාමාජිකයන් සඳහා

ත්‍රිවිධ හමුදා සාමාජිකයන් සඳහා මෙම චක්‍රලේඛයේ 04 ඡේදයට අනුරූප වන පරිදි රු. 3000/- ක මාසික අන්තර් දීමනාවක් ගෙවිය යුතුය.

## 06. රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු නිලධරයන් සඳහා

සාමූහික ගිවිසුම් මඟින් හෝ අවබෝධතා ගිවිසුමකින් වැටුප් තීරණය කරනු ලබන ආයතන හැර අනෙකුත් සියලුම රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු වූවන් සඳහා මෙහි 6:1 හා 6:2 හි සඳහන් විධිවිධාන පරිදි රු.3000/- ක මාසික අන්තර් දීමනාවක් ගෙවිය යුතුය.

6:1 2009.06.01 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ 30 (1) හි සඳහන් පරිදි රු. 24,725/- කට අඩු ආරම්භක වැටුප් පියවරක් සහිත මාසික වැටුප් පරිමාණ හිමි තනතුරුවල සේවය කරන නිලධරයන් සඳහා 2015.06.30 දක්වා.

6:2 2009.06.01 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ 30 (1) හි සඳහන් පරිදි රු. 24,725/- ක් හෝ ඊට වැඩි ආරම්භක වැටුප් පියවරක් සහිත මාසික වැටුප් පරිමාණ හිමි තනතුරුවල සේවය කරන නිලධරයන් සඳහා 2015.08.31 දක්වා.

## 07. රාජ්‍ය සේවයේ, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල තාවකාලික පදනම මත හෝ දෛනික වේතනය මත සේවය කරන සේවකයන් සඳහා

7:1 තාවකාලික පදනම මත සේවයේ යොදවා ඇති සේවකයන් සඳහා අදාල වන පරිදි ඉහත 04 හි හෝ 06 හි සඳහන් පරිදි අන්තර් දීමනාවක් ගෙවිය යුතුය.

7:2 අනියම් පදනම මත දෛනික වේතනය ලබන සේවකයන් සඳහා අදාල වන පරිදි ඉහත 04 හි හෝ 06 හි සඳහන් පරිදි අන්තර් දීමනාවක් එක් එක් මාසයේ සේවය කර ඇති එක් දිනකට 1/30 බැගින් වන පදනම මත ගණනය කර ගෙවිය යුතුය.

## 08. ආධුනික හා පුහුණුලාභීන් සඳහා

2006.11.10 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 (II) හි 14 වන ඡේදයේ ඇතුළත් තනතුරු සඳහා ඉහත 04 හි සඳහන් පරිදි මාසික අන්තර් දීමනාවක් ගෙවිය යුතුය.

## 09. පෞද්ගලික කාර්ය මණ්ඩල සඳහා


ගරු අමාත්‍යවරුන්ගේ, ගරු නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ සහ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ අනුමත පෞද්ගලික කාර්ය මණ්ඩල සඳහා ද, පළාත් සභාවල ගරු ආණ්ඩුකාරවරු, ගරු ප්‍රධාන අමාත්‍යවරු හා ගරු පළාත් සභා අමාත්‍යවරුන්ගේ අනුමත පෞද්ගලික කාර්ය මණ්ඩල සඳහා ද කැබිනට් අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ හා පළාත් ප්‍රධාන ලේකම්වරුන්ගේ සම්බන්ධීකරණ ලේකම්වරුන් සඳහා ද ඉහත 04 හි සඳහන් පරිදි මාසික අන්තර් දීමනාවක් ගෙවිය යුතුය.

## 10. විශ්‍රාම වැටුප්ලාභීන් සඳහා

නව වැටුප් ව්‍යුහය අනුව විශ්‍රාම වැටුප් ප්‍රතිශෝධනය කර එය ක්‍රියාත්මක කෙරෙන තුරු සියලුම විශ්‍රාමිකයන් සඳහා 2014 නොවැම්බර් මස සිට මාසිකව රු. 2500/- ක අන්තර් දීමනාවක් ගෙවිය යුතුය.

11. රාජ්‍ය නිලධරයන් සහ විශ්‍රාමිකයින් සඳහා ඉහත සඳහන් පරිදි ගෙවනු ලබන මෙම මාසික දීමනාව දැනට ගෙවන වැටුප් හා අනෙකුත් දීමනාවන්ට අමතරව "අන්තර් දීමනාව" ලෙස ගෙවිය යුතුය.

12. මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකඟතාව මත නිකුත් කරනු ලබන අතර මෙහි සඳහන් උපදෙස් ක්‍රියාත්මක කිරීමේදී පැහැදිළි කිරීමක් අවශ්‍ය වන්නේ නම් ආයතන අධ්‍යක්ෂ ජනරාල් විමසිය යුතුය. (දුරකතන අංකය 011 2688330, විද්‍යුත් ලිපිනය dge@pubad.gov.lk)



පී.බී. අබේකෝන්
ලේකම්
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය